# රට තුළට පැමිණෙන විදේශීය ගෘහ සහායකයින් සඳහා නිරෝධායන විධිවිධාන

## (2022 අගෝස්තු 23 දින යාවත්කාලීන කරන ලද)

## නිරෝධායන වැඩපිළිවෙළ

අගෝස්තු 12 සිට හොංකොං හි සේවයට පැමිණෙන විදේශීය ගෘහ සහායකයින් (FDHs) "3+4" ආකෘතිය යටතේ නිරෝධායනය කිරීමට යටත් වේ (අනෙකුත් විදේශ සංචා කයින් මෙන්), එනම් ඔවුන් නම් කරන ලද නිරෝධායන හෝටල් (DQHs) වල දින තුනක්ද පසුව නිවසේ වෛද්‍ය අධීක්ෂණය යටතේ දින හතරක්ද වශයෙන් අනිවාර්ය නිරෝධායනයකට ලක් වනු ඇත. වෛද්‍ය අධීක්ෂණ ාලය තුළ සහ ඉන් පසු දින තුනක නිරීක්ෂණ කාලය තුළ ඔවුන්ට විවිධ පරීක්ෂණ වලට ලක්වීමට සිදුවනු ඇත. වෛද්‍ය අධීක්ෂණ ාලය තුළ එන්නත් අවසර පත්‍රය යටතේ වන කහ කේත සීමා කිරීම්වලට යටත් වන අතර, මුහුණු ආවරණ ඉවත් කිරීම හෝ කණ්ඩායම් ක්‍රියා කම් ඇතුළත් අධි අවදානම් සහිත පරිශ්‍රයන්ට මෙන්ම ප්‍රධාන ආරක්ෂාවක් අවශ්‍ය අනෙකුත් පරිශ්‍රයන්ට ඇතුළු වීමට ඉඩ නොදෙනු ඇත (කරුණා පහත "සේවායෝජකයන් සහ රැකියා නියෝජිතායතන සඳහ මතක් කිරීම්" යටතේ වන (h) බලන්න).

<u>"3+4" ආකෘතිය යටතේ නිරෝධායන සහ පරීක්ෂණ විධිවිධාන පිළිබඳ විස්තර:</u>

| | |
|---|---|
| පැමිණ පළමු දිනය<br>(දින 0) | • පළමු නියුක්ලෙයික් අම්ල පරීක්ෂණය සිදු කරන්න; |
| දින 3ක අනිවාර්ය නිරෝධායනය<br>(දින 1 සිට 3 දක්වා) | • DQHs හි රාත්‍රී තුනක් අනිවාර්ය නිරෝධායනයකට භාජනය වීම (DQHs පිළිබඳ තොරතුරු (කාමර ාස්තු ඇතුළුව) [මෙම ලැයිස්තුවේ] සපයා ඇත);<br><br>• දිනපතා වේගවත් ප්‍රතිදේහජන පරීක්ෂණය (RAT) සිදු කිරීම;<br><br>• DQHs හි සිටිනා 2 වන දින නියුක්ලෙයික් අම්ල පරීක්ෂණය සිදු කිරීම;<br><br>• අඛණ්ඩ පරීක්ෂණ ප්‍රතිඵල ලබ ගැනීමෙන් පසුව 3 වන දින උදෑසන |

| | |
|---|---|
| | අනිවාර්ය නිරෝධායනය අවසන් කිරීම; |
| දින 4ක වෛද්‍ය අධීක්ෂණය<br>(දින 4 සිට 7 දක්වා) | • ඔවුන්ගේ සේවා යෝජකයන්ගේ නිවසේ හෝ DQHs නොවන බලපත්‍රලාභී හෝටල්වල හෝ නවාතැන්පොලවල් වල රාත්‍රී හතරක් වෛද්‍ය අධීක්ෂණවලට භාජනය වීම;<br><br>• දෛනික RAT පරීක්ෂණ සිදු කිරීම;<br><br>• නිශේධ RAT ප්‍රතිඵලයක් ලබා ගැනීමෙන් පසුව එදින FDHs හට තම සේවා යෝජකයන්ගේ නිවසේ සේවය කළ හැකි අතර පිටතට යා හැක, නමුත් ඔවුන් එන්නත් අවසර පත්‍රය යටතේ වන කහ කේත සීමා කිරීම් වලට යටත් වනු ඇත; හා<br><br>• 4 සහ 6 වැනි දින වල නිශේධ RAT ප්‍රතිඵලයක් ලබා ගැනීමෙන් පසු, එම දිනවලම ප්‍රජා මධ්‍යස්ථානයක (නොමිලේ), ජංගම නිදර්ශක එකතු කිරීමේ මධ්‍යස්ථානයක (නොමිලේ) හෝ තමන් විසින් මුදල් ගෙවා රජය විසින් පිළිගත් දේශීය වෛද්‍ය ආයතනයක නියුක්ලෙයික් අම්ල පරීක්ෂණ සිදු කර ගැනීම අවශ්‍ය වේ. |
| අඛණ්ඩ නිරීක්ෂණ සහ පරීක්ෂණ<br>(දින 3ක ස්වයං නිරීක්ෂණය)<br>(දින 8 සිට 10 දක්වා) | • ඔවුන්ගේ සේවා යෝජකයන්ගේ නිවසේ හෝ DQHs නොවන බලපත්‍රලාභී හෝටල්වල හෝ නවාතැන්පොලවල් වල රාත්‍රී තුනක් ස්වයං-අධීක්ෂණයට භාජනය වීම;<br><br>• දෛනික RAT පරීක්ෂණ සිදු කිරීම;<br><br>• නිශේධ RAT ප්‍රතිඵලයක් ලබා ගැනීමෙන් පසුව එදින FDHs හට තම සේවා යෝජකයන්ගේ නිවසේ සේවය කළ හැකි අතර පිටතට යා හැක, නමුත් ඔවුන් තවදුරටත් එන්නත් අවසර පත්‍රය යටතේ වන කහ කේත |

| | |
|---|---|
| | සීමා කිරීම් වලට යටත් නොවනු ඇත; හා<br><br>● 9 වන දින RAT ප්‍රතිඵලයක් ලබා ගැනීමෙන් පසුව, එදිනම ප්‍රජා මධ්‍යස්ථානයක (නොමිලේ), ජංගම නිදර්ශක එකතු කිරීමේ මධ්‍යස්ථානයක (නොමිලේ) හෝ තමන් විසින් මුදල් ගෙවා රජය විසින් පිළිගත් දේශීය වෛද්‍ය ආයතනයක නියුක්ලෙයික් අම්ල පරීක්ෂණය සිදු කර ගැනීම අවශ්‍ය වේ. |

**උදාහරණයක් ලෙස:** අගෝස්තු 12 වන දින හොංකොං තුළට ඇතුළු වන FDH කෙනෙකු නම්, ඇතුළු වන දිනය දින 0 වේ. ඔවුන් 3 වන දින (අගෝස්තු 15) උදෑසන DQH හි නිරෝධායනය සම්පූර්ණ කරනු ඇත, සහ 7 වන දින (අගෝස්තු 19) උදෑසන වෛද්‍ය අධීක්ෂණය සම්පූර්ණ කරනු ඇත. වෛද්‍ය අධීක්ෂණ සහ පසුකාලීන ස්වයං- නිරීක්ෂණ කාලය තුළ, FDH හට 4 වන දින (අගෝස්තු 16) සිට 10 වන දින (අගෝස්තු 22) දක්වා (දින දෙකම ඇතුළුව) දිනපතා RAT පරීක්ෂණ සහ 4 වන දින (අගෝස්තු 16), 6 වන දින (අගෝස්තු 18) සහ 9 වන දින (අගෝස්තු 21) වලදී නියුක්ලෙයික් අම්ල පරීක්ෂණය සිදු කළ යුතුය.

**සංක්‍රාන්ති විධිවිධාන:** අගෝස්තු 12 වන දිනට පෙර DQHs හි අවම වශයෙන් රාත්‍රී තුනක් නිරෝධායනය වී ඇති FDHs සඳහා, ඔවුන්ගේ නිශේධ නියුක්ලෙයික් අම්ල පරීක්ෂණයේ ප්‍රතිඵල සනාථ කිරීමෙන් පසුව අගෝස්තු 9 සිට 12 දින දක්වා ක්‍රමානුකූලව හෝටල්වලින් පිටත් කිරීමට රජය කටයුතු කරනු ඇත. DQHs සිට පැමිණීමෙන් පසුව, FDHs නිවසේ වෛද්‍ය අධීක්ෂණ වලට, එන්නත් අවසර පත්‍රය යටතේ වන කහ කේත සීමා කිරීම් වලට සහ එම දිනවලදී DQHs වලින් පිටත් වී ඇත්නම් දින 4, දින 6 සහ දින 9 වල නියුක්ලෙයික් අම්ල පරීක්ෂණ වලට යටත් වේ. ඔවුන් දිනපතා RAT පරීක්ෂණ වලටද යටත් විය යුතුය.

## පිටත්වීමේ අවශ්‍යතා

වලංගු සංචාරක ලේඛනයක් සහ වලංගු රැකියා වීසා බලපත්‍රයක් ඇති FDHs හට සාමාන්‍ය සංක්‍රමණ රෙගුලාසිවලට යටත්ව හොංකොං වෙත ඇතුළු වීමට/නැවත ඇතුළු විය හැක. අදාළ කාලසීමාව තුළ (හොංකොං වෙත පැමිණීම සඳහා පිටත්වීමේ දිනය /හොංකොං වෙත පැමිණෙන දිනය හෝ ඊට පෙර දින 14 තුළ) චීනයෙන් පිටත ඕනෑම ස්ථානයක රැඳී සිටි එන්නත් ලබා ගැනීම සම්පූර්ණ කරන ලද FDHs සඳහා පිටත්වීමේ අවශ්‍යතා පහත පරිදි වේ:

(අ). (i) පැය 48ක් ඇතුළත සිදුවූ PCR මත පදනම් වූ නියුක්ලෙයික් අම්ල පරීක්ෂණයක COVID-19 නිශේධ ප්‍රතිඵල සාක්ෂි; හෝ (ii) හොංකොං හි ගොඩබෑ දින සිට දින 14 සිට 90 දක්වා කාලය

තුළ වෛරසය ආසාදනය වී තිබූ බව පෙන්වීමට ලේඛනගත සාක්ෂියක් සහ පිටත්ව යාමට නියමිත වේලාවේ සිට පැය 24ක් ඇතුළත සිදු කරන ලද නිශේධ RAT ප්‍රතිඵලයක්.

(ආ). සෞඛ්‍ය ප්‍රකාශන QR කේතය (එන්නත් වාර්තා ප්‍රකාශය ඇතුළුව) (කරුණාකර පහත "හොංකොං වෙත පිටත්වීමේ ක්‍රියා පටිපාටි සහ පැමිණීමේ දී සිදුවන නිරෝධායනය සහ පරීක්ෂණ" බලන්න); හා

(ඇ). (සෞඛ්‍ය ප්‍රකාශයේ QR කේතය කොළ පැහැ නොවේනම්) හොංකොං වෙත පැමිණි දිනයේ සිට රාත්‍රී 3 ක් සඳහා තහවුරු කරන ලද DQH හි කාමර වෙන් කිරීමක්

## හොංකොං වෙත පිටත්වීමේ ක්‍රියා පටිපාටි සහ පැමිණීමේ දී සිදුවන නිරෝධායනය සහ පරීක්ෂණ

2022 අගෝස්තු 12 දින උදෑසන 0.00 සිට (හොංකොං වේලාවෙන්), හොංකොං වෙත පැමිණෙන සියලුම FDHs හට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මාර්ගගත සෞඛ්‍ය සහ නිරෝධායන තොරතුරු ප්‍රකාශය (https://www.chp.gov.hk/hdf/) කල්තියා සම්පූර්ණ කිරීමෙන්, එන්නත් ලබා ගැනීම සම්පූර්ණ කල බවට වාර්තාව ප්‍රකාශ කිරීමෙන් සහ කාමර වෙන්කරවා ගැනීම පිලිබඳ තොරතුරු සැපයීමෙන් පිටත්වීමේ අවශ්‍යතා සපුරාලීම අවශ්‍ය වේ. පද්ධතිය මඟින් DQH හි වෙන්කරවා ගැනීම පිලිබඳ තොරතුරු සාර්ථක ලෙස තහවුරු කර ගැනීමෙන් පසුව, FDHs වෙත කොළ පැහැති සෞඛ්‍ය ප්‍රකාශන QR කේතයක් ලැබෙනු ඇත. කොළ පැහැති සෞඛ්‍ය ප්‍රකාශන QR කේතයක් සහිත පුද්ගලයින්ට එන්නත් වාර්තා තවදුරටත් තහවුරු කිරීමට සහ ගුවන් යානයට ඇතුළු වීමේදී DQH හි වෙන්කරවා ගැනීම තහවුරු කිරීමට අවශ්‍ය නොවේ. හොංකොං වෙත පැමිණි පසුවද, ඔවුන්ට කොළ පැහැති සෞඛ්‍ය ප්‍රකාශන QR කේතය සහිත “කඩිනම් මාර්ග” භාවිත කළ හැකි අතර DQHs වෙත සෘජු ප්‍රවාහනයට ගොඩ විය හැකිය.

එන්නත් ප්‍රකාශය පිටත්වීමේ අවශ්‍යතා සපුරාලන නමුත් පද්ධතියට ඔවුන්ගේ DQH හි වෙන්කරවා ගැනීමේ තොරතුරු තහවුරු කිරීමට නොහැකි වන රට තුළට පැමිණෙන FDHs සඳහා, රෝස පැහැති සෞඛ්‍ය ප්‍රකාශන QR කේතයක් නිකුත් කරනු ලැබේ. ගුවන් යානයට ඇතුළු වීමේදී DQH හි වෙන්කරවා ගැනීමේ ලියකියවිලි ඉදිරිපත් කිරීමට ඔවුන්ට සිදුවනු ඇත.

ගුවන්යානාවලට ගොඩ වන පුද්ගලයින්ට ගුවන් යානයට ඇතුළු වීමේදී ගුවන් සමාගම් වලට තහවුරු කරගැනීම සඳහා සෞඛ්‍ය ප්‍රකාශන QR කේතය (එය QR කේතයේ බාගත කළ හැකි අනුවාදයක්, තිර පිටපතක් හෝ මුද්‍රණයක් විය හැකිය) ඉදිරිපත් කළ යුතුය.

ඉහත විධිවිධාන පිළිබඳ විස්තර සඳහා කරුණාකර අගෝස්තු 8 වැනි දින රජය විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනය බලන්න (www.info.gov.hk/gia/general/202208/08/P2022080800803.htm).

## සේවායෝජකයන් සහ රැකියා නියෝජිතායතන සඳහා මතක් කිරීම්

(අ) සේවා යෝජකයින් සහ රැකියා නියෝජිතායතන (EAs) ඔවුන්ගේ FDHs හොංකොං වෙත පැමිණීමට කටයුතු කිරීමේදී ගුවන් ගමන් තොරතුරු පරීක්ෂා කර අවශ්‍ය ලියකියවිලි සකස්

කිරීමට සහ ක්‍රියා පටිපාටි සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දිය යුතුය. සේවා යෝජකයින් සහ EAs ඔවුන්ගේ FDHs සඳහා නිරෝධායන කාමරයක් රාත්‍රී 3ක් සඳහා වෙන් කරවා ගත යුතුය. වෙන් කරවා ගැනීමේ කිසියම් වෙනසක් තිබේ නම්, FDHs දැනුවත් කර වඩාත්ම යාවත්කාලීන කාමර කරවා ගැනීමේ ලේඛන ලබා දිය යුතුය. පවුලේ සාමාජිකයන් හෝ සහචරයින් සමඟ කාමරයක් බෙදා ගැනීමට කැමති FDHs හට, අදාළ විස්තර සඳහා, කරුණාකර COVID-19 තේමාත්මක වෙබ් අඩවියේ නිතර අසන පැන (ආපසු පැමිණෙන අය සඳහා) යටතේ වන Q13 කියවීමට මෙතැන ක්ලික් කරන්න.

FDHs සඳහා වන සම්මත රැකියා ගිවිසුමට අනුව, සේවා යෝජකයෙකු FDHs හට සුදුසු නවාතැන් නොමිලයේ සැපයිය යුතු බව කරුණාවෙන් සලකන්න. නුසුදුසු නවාතැන් සඳහා උදාහරණ අතර විරුද්ධ ලිංගික වැඩිහිටි/යෞවනයෙකු සමඟ කාමරයක් බෙදා ගැනීම ඇතුළත් නමුත් එයට පමණක් සීමා නොවේ.

(ආ) තනි තනි පවුල්වල කොන්දේසි සැලකිල්ලට ගනිමින්, දින හතරක වෛද්‍ය අධීක්ෂණය සහ පසුව දින තුනක ස්වයං නිරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා අනිවාර්ය නිරෝධායන කටයුතු සඳහා වන හෝටල් හැර බලපත්‍රලාභී හෝටල්වල/නවාතැන්පොලවල් වල නවාතැන් ගැනීමට FDHs හට සලසා දීමට කම්කරු කොමසාරිස් විසින් සේවා යෝජකයන්ට ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දී ඇත. කම්කරු දෙපාර්තමේන්තුවට (LD) අයදුම්පතක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. සේවා යෝජකයන් හෝ EAs බලපත්‍රලාභී හෝටල්වල හෝ DQHs නොවන නවාතැන්පොලවල් වල වෛද්‍ය අධීක්ෂණය සහ ස්වයං නිරීක්ෂණය සඳහා FDHs හට සලසා කැමති නම්, කරුණාකර බලපත්‍රලාභී හෝටල් සහ නවාතැන්පොලවල් ලැයිස්තුව සඳහා මෙතැන ඔබන්න.

(ඇ) ගුවන් යානයට ඇතුළු වීමේදී ගුවන් සමාගම් වලට තහවුරු කරගැනීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මාර්ගගත සෞඛ්‍ය සහ නිරෝධායන තොරතුරු ප්‍රකාශය (https://www.chp.gov.hk/hdf/) කල්තියා සම්පූර්ණ කරන ලෙසත්, කොළ පැහැති QR කේතයක් (එය QR කේතයේ බාගත කළ හැකි අනුවාදයක්, තිර පිටපතක් හෝ මුද්‍රණයක් විය හැකිය) ලබා ගැනීම සඳහා එන්නත් ලබා ගැනීම සම්පූර්ණ කළ බව සඳහන් වාර්තාව ප්‍රකාශ කිරීමටත්, DQHs හි වෙන්කරවා ගැනීමේ තොරතුරු සැපයීමටත් සේවා යෝජකයින් සහ රැකියා නියෝජිතායතන (EAs) FDHs වෙත මතක් කළ යුතුය.

(ඈ) DQHs හි රාත්‍රී 3ක අනිවාර්ය නිරෝධායනය අවසන් කර ඇති FDHs හට දින 4ක වෛද්‍ය අධීක්ෂණ සහ දින 3ක ස්වයං නිරීක්ෂණය පවත්වා ගනිමින් 4 වන දින සිට තම සේවා යෝජකයන්ගේ නිවසේ වැඩ ආරම්භ කළ හැක. 4 වන දින සිට 10 වන දිනය දක්වා (දින දෙකම ඇතුළුව) දිනපතා RAT පරීක්ෂණ ද, 4 වන දින, 6 වන දින සහ 9 වන දින ද ප්‍රජා මධ්‍යස්ථානයකදී (නොමිලේ), ජංගම නිදර්ශක එකතු කිරීමේ මධ්‍යස්ථානයකදී (නොමිලේ) ද නියුක්ලෙයික් අම්ල පරීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය වේ. නැතහොත් RAT පරීක්ෂණයකට නිශේධ ප්‍රතිඵලයක් ලබා ගත් පසු එදිනම රජය විසින් පිළිගත් දේශීය වෛද්‍ය ආයතනයක මුදල් ගෙවා පරීක්ෂණයක් සකසා ගන්න. නියමිත නිලධාරීන් විසින් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණයේ ප්‍රතිඵල මෙන්ම RAT පරීක්ෂණ ප්‍රතිඵලවල ඡායාරූප අඩංගු සියලුම SMS (ජංගම දුරකථන කෙටි පණිවිඩ) දැනුම්දීම් FDHs විසින් ළඟ තබා ගත යුතුය.

(ඉ) අගෝස්තු 12 ට පෙර DQHs හි අවම වශයෙන් රාත්‍රී තුනක් නිරෝධායනය අවසන් කර ඇති FDHs හට DQHs වලින් පිටවීමට අවසර ලබා දී ඇත්නම්, ඔවුන් ඔවුන්ගේ සේවා යෝජකයාගේ නිවසේ හෝ බලපත්‍රලාභී හෝටල්වල /නවාතැන්පොලවල් වල වෛද්‍ය අධීක්ෂණ සහ ස්වයං නිරීක්ෂණවලට ද, එන්නත් අවසර පත්‍රය යටතේ වන කහ කේත සීමා කිරීම්වලට (වෛද්‍ය අධීක්ෂණ අතරතුර) ද, එම දිනවලදී DQHs වලින් පිටත් වී ඇත්නම් දිනපතා වන RAT පරීක්ෂණ වලටද දින 4, දින 6 සහ දින 9 වල නියුක්ලෙයික් අම්ල පරීක්ෂණ වලටද යටත් වනු ඇත.

රජය සහ DQHs අතර ගිවිසුමට අනුව, නිරෝධායන ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් අනිවාර්ය නිරෝධායන කාලයේ යම් අඩුවීමක් සිදු වුවහොත්, DQHs විසින් වෙන්කරවා ගත් තැනැත්තාට ඉතිරි දින සඳහා කාමර ගාස්තුව ආපසු ගෙවිය යුතුය.

(ඊ) නිරෝධායන හෝටල්වල කාමර වෙන් කරවා ගැනීම සඳහා සේවා යෝජකයින් සහ EAs නේවාසික FDHs ගේ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ දැක්වෙන පරිදි සැබෑ නම භාවිතා කර ලියාපදිංචි විය යුතුය. වෙන්කරවා ගැනීමට පෙර, සේවා යෝජකයන් සහ EAs අදාළ හෝටලයේ නියමයන් සහ කොන්දේසි හොඳින් කියවිය යුතුය.

(උ) වෛද්‍ය අධීක්ෂණ අතරතුර කහ කේතයට යටත් වන FDHs හට අඩු අවදානම් සහිත දෛනික අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ හැක, උදා ප්‍රවාහනය පාවිච්චි කිරීම, සුපිරි වෙළඳසැල් සහ වෙළඳ පොළවල්වලට ඇතුළු වීම යනාදිය.

(ඌ) කහ කේත ප්‍රභේදයට යටත් වන පුද්ගලයින්ට එන්නත් අවසර පත්‍රය යටතේ " සක්‍රීය පරීක්ෂාවට" යටත්ව පහත පරිශ්‍රවලට සහ පාරිභෝගිකයකු හෝ අමුත්තකු ලෙස වෙනත් පරිශ්‍රයකට ඇතුළු විය නොහැක:

- එන්නත් අවසර පත්‍රයේ " සක්‍රීය පරීක්ෂාවට" යටත් වන රෝග වැළැක්වීම සහ පාලනය (අවශ්‍යතා සහ නිර්දේශ) (ව්‍යාපාර සහ පරිශ්‍ර) නියාමනය (599F වගන්තිය) යටතේ නියාමනය වන පරිශ්‍ර:

  - QR කේත පරීක්ෂා වන ස්කෑනරය භාවිතා කිරීමට අවශ්‍ය වන හා 599F වගන්තිය යටතේ නියාමනය කෙරෙන පරිශ්‍රයන්, එනම් ආහාර සැපයීමේ ව්‍යාපාරික ස්ථාන (බාර් හෝ සුරාසැල් ඇතුළුව), විනෝද ක්‍රීඩා මධ්‍යස්ථාන, නානකාමර, ව්‍යායාම මධ්‍යස්ථාන, විනෝද ස්ථාන, ගෘහස්ථ පොදු විනෝදාස්වාද ස්ථාන, උත්සව ශාලා, රූපලාවන්‍යාගාර සහ සම්බාහන ආයතන, සමාජ ශාලා, සමාජ ශාලා හෝ රාත්‍රී සමාජශාලා, කැරෝකී ආයතන , මජොං ටින් කඹ පරිශ්‍රයන්, ගෘහස්ථ ක්‍රීඩා පරිශ්‍ර, පිහිනුම් තටාක, සංචාරක නැව්, ගෘහස්ථ උත්සව පරිශ්‍ර, බාබර් සාප්පු හෝ කොණ්ඩා මෝස්තර ආයතන සහ ආගමික පරිශ්‍රයන්.

  - එන්නත් අවසර පත්‍රය හැකිතාක් දුරට දෘශ්‍යමය වශයෙන් පරීක්ෂා කිරීමට අවශ්‍ය ස්ථාන, එනම් එළිමහන් පොදු විනෝදාස්වාද ස්ථාන, එළිමහන් ක්‍රීඩා පරිශ්‍ර සහ එළිමහන් උත්සව පරිශ්‍ර.

- වෙනත් ස්ථාන: වැඩිහිටි නිවාස, අබාධිත පුද්ගලයන් සඳහා නේවාසික සාත්තු නිවාස, පාසල් සහ නම් කරන ලද සෞඛ්‍ය සේවා පරිශ්‍ර.

**FDH සඳහා මතක් කිරීම්**

**<u>පිටත්වීමේ අවශ්‍යතා</u>** දැඩි ලෙස පිළිපදින ලෙස රජය FDH හට  මතක් කර සිටී. FDH අදාළ අවශ්‍යතා සපුරාලීමට අසමත් වුවහොත්, FDH හට හොංකොං වෙත ගමන් කරන ගුවන් යානයකට ගොඩවීමට ඉඩ නොදෙනු ඇත හෝ ලඟා වීමෙන් පසු හොංකොං වෙත ඇතුළුවීම ප්‍රතික්ෂේප විය හැකිය. රෝග වැළැක්වීම සහ පාලනය (සීමා හරහා ප්‍රවාහනය සහ සංචාරකයින් පිලිබඳ වන නියාමනය) රෙගුලාසි (599F වගන්තිය) යටතේ, හොංකොං වෙත පැමිණෙන සංචාරකයෙකු තොරතුරු සැපයීමේ අවශ්‍යතාවයකට අනුකූල වීමට අපොහොසත් වුවහොත්, හෝ දැනුවත්ව හෝ නොසැලකිලිමත් ලෙස වැදගත් කරුණක් සම්බන්ධයෙන් යම් අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරක් ලබා දුනහොත්, ඔහු හෝ ඇය වරදකරු කිරීම මත 3 මට්ටමේ ($10,000) උපරිම දඩයකට සහ මාස හයක සිර දඬුවමකට යටත් වේ.

කිසියම් සැක සහිත උල්ලංඝනයක් අනාවරණය වුවහොත්, පරීක්ෂණ පැවැත්වීම සහ නඩු පැවරීම සලකා බැලීම හැරුණු විට, රජය විසින් හොංකොං හි අදාළ කොන්සල් ජනරාල්වරයාට සහ ආගමන දෙපාර්තමේන්තුවට ද දැනුම් දෙනු ඇත. FDH ගේ අනාගත රැකියා වීසා අයදුම්පත් බලපෑමට ලක්විය හැක.

විදේශ ස්ථාන වලින් හොංකොං වෙත පැමිණෙන පුද්ගලයින්ගේ අනිවාර්ය නිරෝධායනය සඳහා වන නියාමනය (599F වගන්තිය) යටතේ මෙම ආපසු පැමිණෙන්නන්ට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් අනිවාර්ය නිරෝධායන නියෝග නිකුත් කරනු ඇත. මුළු නිරෝධායන කාලය තුළම ඔවුන් තම හෝටල් කාමරවලින් පිටව යාම හෝ හෝටලය තුළ එහා මෙහා යාම නොකළ යුතුය. නියමිත කාමරවලින් පිටවීම නිරෝධායන නියෝගය කඩ කිරීමක් ලෙස සලකනු ලබන අතර එය සාපරාධී වරදක් වේ. වැරදිකරුවන් මාස හයක උපරිම සිරදඬුවමක් සහ ඩොලර් 25,000 ක දඩයකට යටත් වේ.

අනිවාර්ය පරීක්ෂණ සම්බන්ධයෙන්, රජය FDHs හට 4 වන දින සිට 10 වන දින දක්වා දිනපතා RAT පරීක්ෂණද  4 වන දින, 6 වන දින සහ 9 වන දින නියුක්ලෙයික් අම්ල පරීක්ෂණ වලටද භාජනය වන ලෙස මතක් කර දෙයි. නියමිත නිලධාරීන් විසින් පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණයේ ප්‍රතිඵල මෙන්ම RAT පරීක්ෂණ ප්‍රතිඵලවල ඡායාරූප අඩංගු සියලුම SMS (ජංගම දුරකථන කෙටි පණිවිඩ) දැනුම්දීම් FDHs විසින් ළඟ තබා ගත යුතුය. අනිවාර්ය පරීක්ෂණ දැනුම්දීම හෝ අනිවාර්ය පරීක්ෂණ නිර්දේශයට අනුකූල වීමට අපොහොසත් වන ඕනෑම පුද්ගලයෙකු වරදක් සිදු කරන අතර වරදකරු වූ පසු උපරිම දඬුවම 4 මට්ටමේ ($ 25,000) දඩයක් සහ මාස හයක සිරදඬුවමක් වේ. වරදේ වගකීම් ඉවත් කිරීම සඳහා ස්ථාවර දඬුවම ඩොලර් 10,000 කි. නිශ්චිත කාල රාමුවක් තුළ ඔහු/ඇය පරීක්ෂාවට ලක් කළ යුතු බවට අනිවාර්ය පරීක්ෂණ නියෝගයක් ද එම පුද්ගලයා වෙත නිකුත් කළ හැකිය. නියෝගයට අනුකූල වීමට අපොහොසත් වීම වරදක් වන අතර වරදකරු 5 මට්ටමේ ($ 50,000) දඩයකට සහ මාස හයක සිර දඬුවමකට යටත් වේ.

**<u>අදාල තොරතුරු</u>**

- 2022 අගෝස්තු 8 වැනි දින රජයේ මාධ්‍ය නිවේදනය "රට තුළට පැමිණෙන පුද්ගලයින් සඳහා නිරෝධායන විධිවිධාන සඳහා සැකසීම් රජය විසින් නිවේදනය කරයි"
- 2022 අගෝස්තු 10 වන දින LD හි මාධ්‍ය නිවේදනය "විදේශීය ගෘහ සහායකයින් සඳහා නවතම නිරෝධායන විධිවිධානය"
- හොංකොං වෙත පැමිණෙන පුද්ගලයින් සඳහා පිටත්වීමේ සහ නිරෝධායන කටයුතු
- අනිවාර්ය නිරෝධායන කාල සීමාව තුළ රට තුළට පැමිණෙන සංචාරකයින් සඳහා සෞඛ්‍ය උපදෙස්
- නිරෝධායනය සඳහා හෝටලයේ රැඳී සිටින විට දැන සිටිය යුතු කරුණු
- රට තුළට පැමිණෙන සංචාරකයින් සඳහා ස්වයං නිරීක්ෂණ කාලසීමාව සම්බන්ධයෙන් දැන සිටිය යුතු කරුණු
- 2022 අගෝස්තු 8 වැනි දින රජයේ මාධ්‍ය නිවේදනය “වැඩි දියුණු කළ එන්නත් අවසර පත්‍ර කෘත්‍ය රජය නිවේදනය කරයි”

පහත දැක්වෙන භාෂා සඳහා, කරුණාකර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවියේ ඇති “රට තුළට පැමිණෙන සංචාරකයින් සඳහා සෞඛ්‍ය නිරෝධායන විධිවිධාන” යන කොටස බලන්න.

- ඉන්දුනීසියානු බහසා භාෂාව: www.chp.gov.hk/en/features/102790.html#HQA01

- බෙංගාලි භාෂාව: www.chp.gov.hk/en/features/102796.html#HQA01

- හින්දි භාෂාව: www.chp.gov.hk/en/features/102743.html#HQA01

- නේපාලි භාෂාව: www.chp.gov.hk/en/features/102786.html#HQA01

- තගලොග් භාෂාව: www.chp.gov.hk/en/features/102791.html#HQA01

- තායි භාෂාව: www.chp.gov.hk/en/features/102788.html#HQA01

- සිංහල භාෂාව: www.chp.gov.hk/en/features/102799.html#HQA01

- උර්දු භාෂාව: www.chp.gov.hk/en/features/102787.html#HQA01

- වියට්නාම භාෂාව: www.chp.gov.hk/en/features/102797.html#HQA01

## <u>විමසීම්</u>

*සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

- සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානයේ ක්ෂණික ඇමතුම් අංකය: 2125 1111 / 2125 1122 / 183 0111
- අනිවාර්ය පරීක්ෂණ සම්බන්ධ ක්ෂණික ඇමතුම් අංකය: 6275 6901
- HKSAR රජයේ COVID-19 WhatsApp උපකාරක අංකය: 9617 1823

*LD*

විමසීම් සඳහා, කරුණාකර FDH සඳහා කැප වූ ක්ෂණික ඇමතුම් අංකය 2157 9537 (“1823” විසින් මෙහෙයවනු ලබන) හෝ fdh-enquiry@labour.gov.hk වෙත විද්‍යුත් තැපෑලෙන් LD හා සම්බන්ධ වන්න.